සැ. යු.-2015.01.16 දින පළ වූ අංක 1,898 දරන ගැසට් පත්‍රයේ II සහ III කොටස් පළ නොවීය.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,899 - 2015 ජනවාරි මස 23 වැනි සිකුරාදා - 2015.01.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | — | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 71 |


*සැ. යු.*-ධීවර සහ ජලජ සම්පත් (සංශෝධන) පනත් කෙටුම්පත 2014 දෙසැම්බර් මස 19 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට නෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 පෙබරවාරි මස 13 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 ජනවාරි මස 30 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2015 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ භාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**ආපදා කළමනාකරණ අමාත්‍යාංශය**

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව

**ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවයේ විදුලි සංදේශ හා රේඩාර් කාර්මික නිලධාරි (III ශ්‍රේණිය) තනතුරට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2014 (2015)**

1.0 කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවෙහි, පුරප්පාඩු පවත්නා ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවයෙහි විදුලි සංදේශ හා රේඩාර් කාර්මික නිලධාරි (III ශ්‍රේණිය) තනතුරට බඳවා ගැනීම සඳහා පැවැත්වෙන විවෘත තරඟ විභාගය සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1.1 තනතුරු නාමය : විදුලි සංදේශ හා රේඩාර් කාර්මික නිලධාරි

1.2 තනතුරෙහි රාජකාරි ස්වභාවය :

* සියළු විදුලි සහ රේඩාර් උපකරණ නඩත්තුව සහ අළුත්වැඩියා කටයුතු සිදු කිරීම
* පරිගණක පද්ධති, අන්තර්ජාල අළුත්වැඩියා කිරීම්
* දෙපාර්තමේන්තු ප්‍රධානී විසින් පවරනු ලබන වෙනත් කාර්යයන්

2.0 පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම් දිනය පත්වීම් බලධරයා විසින් නිශ්චය කරනු ලැබේ. පුරප්පාඩු සියල්ලම හෝ කිසියම් ගණනක් නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත.

3.0 *වැටුප :*

වගුව - අංක 01

| *ශ්‍රේණිය* | *වැටුප් පරිමාණය* | *ආරම්භක මාසික වැටුප* |
|---|---|---|
| | | 1 වසර මාසිකව රු. 12,920<br>2 වසර මාසිකව රු. 13,040<br>(රා. ප. ච. 06/2006(II) හි 14 වැනි ඡේදයේ 09 වැනි විධිවිධාන අනුව) |
| III ශ්‍රේණිය | මාසිකව රු. 15,005 - 4 x 180 - 6 x 240 - 11 x 320 - 20 x 360 - රු. 27,885<br>(එම්එන්3 - 2006ඒ) | රු. 15,005 |
| II ශ්‍රේණිය | මාසිකව රු. 15,005 - 4 x 180 - 6 x 240 - 11 x 320 - 20 x 360 - රු. 27,885<br>(12 වැනි වැටුප් පියවරෙන් ආරම්භ වේ)<br>(එම්එන් 3 - 2006ඒ) | රු. 17,485 |
| 1 ශ්‍රේණිය | මාසිකව රු. 15,005 - 4 x 180 - 6 x 240 11 x 320 - 20 x 360 - රු. 27,885<br>(23 වැනි වැටුප් පියවරෙන් ආරම්භ වේ.)<br>(එම්එන් 3 - 2006ඒ) | රු. 21,045 |

4.0 *තනතුරෙහි සේවා කොන්දේසි :*

4.1 මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත ය. පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වන අතර, මෙම *ගැසට් නිවේදනයේ* ආරම්භයේ ඇති රාජ්‍ය සේවයට පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසිවලට ද ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවා ව්‍යවස්ථාව හා එයට කලින් කලට කරනු ලබන සංශෝධන, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති, ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි හා රජය මගින් රාජ්‍ය සේවය පිළිබඳව නිකුත් කර ඇති හා කරනු ලබන වෙනත් නියෝග හා රෙගුලාසිවලට ද තෝරාගනු ලබන්නා යටත් වේ.

4.2 රාජ්‍ය භාෂාව නොවන භාෂා මාධ්‍යයකින් බඳවාගත් නිලධාරියෙකු පත් කළ දින සිට අවුරුදු 03ක් ඇතුළත රාජ්‍ය භාෂා පරීක්‍ෂණයෙන් සමත් විය යුතු ය. නියමිත කාලය තුළ මෙම පරීක්‍ෂණයෙන් සමත්වීමට අපොහොසත් වීම ඊළඟ වැටුප් වර්ධක විලම්භනය වීමට හේතු වනු ඇත.

4.3 ස්ථිර පත්වීමේ දින සිට වසර 05ක් ඇතුළත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 1/2014 හි දැක්වෙන පරිදි තම තනතුරට අදාළ වන මට්ටමේ දෙවන රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගත යුතු වේ. අදාළ කාලය තුළ එම ප්‍රවීණතාව ලබා ගැනීමට අපොහොසත් වුවහොත් එම ප්‍රවීණතාව ලබා ගන්නා තුරු වැටුප් වර්ධක නතර කෙරේ.

4.4 රාජකාරි වේලාවන් සෑම විටම සාමාන්‍ය කාර්යාල වේලාවන් නොවන අතර දිවා රාත්‍රී දෙකෙහිම සහ සෙනසුරාදා, ඉරිදා සහ රජයේ නිවාඩු දිනයන්හි ද යෙදෙනු ඇත. කෘත්‍ය ලේඛන අනුවද රාජකාරි කිරීමට සිදුවේ.

4.5 තෝරාගනු ලැබූ ඇයදුම්කරුවන් දිවයිනේ කවර පෙදෙසක වුව ද සේවය කළ යුතු වේ.

5.0 *සුදුසුකම් :-*

5.1 *මූලික සුදුසුකම් :*

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වීම,

(ආ) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවම වයස අවුරුදු 18 වන අතර, උපරිම වයස අවුරුදු 30 වේ.
(ඒ අනුව 1997.02.27 දිනට හෝ ඊට පෙර හා 1985.02.27 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.)

5.2. *අධ්‍යාපන සුදුසුකම් :*

(අ) සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථ සහිතව එකවර විෂයයන් (06) කින් අ. පො. ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම;

*සහ*

(ආ) විෂයයන් 03කින් අ. පො. ස. (උසස් පෙළ) විභාගය එකවර සමත්ව තිබීම, විෂයය සංයුතිය පහත එක් ආකාරයකට විය යුතු ය.
(1) භෞතික විද්‍යාව, ශුද්ධ ගණිතය සහ ව්‍යවහාරික ගණිතය,
(2) භෞතික විද්‍යාව සමග,
(i) ශුද්ධ ගණිතය/ව්‍යවහාරික/සංයුක්ත ගණිතය යන විෂයයන්ගෙන් එකක්,

*සහ*

(ii) රසායන විද්‍යාව/කෘෂි විද්‍යාව/තොරතුරු තාක්ෂණය/පරිගණක විද්‍යාව යන විෂයයන්ගෙන් එකක්.

5.3. *වෘත්තීය සුදුසුකම් :*

(i) රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 6 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

*හෝ*

(ii) මොරටුව විශ්ව විද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව

*හෝ*

(iii) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව

*හෝ*

(iv) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව

*හෝ*

(v) විවෘත විශ්ව විද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව

*හෝ*

(vi) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ පළමුවන කොටස සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබීම.

*හෝ*

(vii) උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ලද ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණ සුදුසුකම්වලට සියළු අතින් සමාන යැයි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

5.4 *කායික සුදුසුකම් :*

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය. බඳවා ගැනීමෙන් පසු පවත්වන වෛද්‍ය පරීක්ෂණයේ දී අයෝග්‍ය බව තහවුරු වුවහොත් තනතුරට නුසුදුසු සේ සලකනු ලැබේ.

6.0 *විභාග පටිපාටිය :-*

විභාගය විෂයයන් දෙකකින් යුත් ලිඛිත පරීක්ෂණයකි. මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍ය වලින් පැවැත්වෙන අතර ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

| | ලැබිය හැකි මුළු ලකුණු ප්‍රමාණය | සමත්වීම සඳහා ලැබිය යුතු අවම ලකුණු ප්‍රතිශතය | කාලය |
|---|---|---|---|
| I. බුද්ධි පරීක්ෂණය | 100 | 40% | පැය 01 |
| II. විෂයානුබද්ධ තාක්ෂණික ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න පත්‍රය | 100 | 40% | පැය 02 |

7.1 *විෂය නිර්දේශය :*

(i) *බුද්ධි පරීක්ෂණය.*—මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාවයත්, ඔහුගේ විශ්ලේෂණ තත්ත්වය තීරණය කිරීමේ ශක්තියත් විනිශ්චය කිරීම සඳහා වන බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50කින් යුක්ත වන අතර ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.

(ii) *විෂයානුබද්ධ තාක්ෂණික ප්‍රශ්න පත්‍රය.*—භෞතික විද්‍යාව සහ ඉලෙක්ට්‍රොනික විද්‍යාව විෂයයන්ට අදාළව අ. පො. ස. (උ.පෙළ) විභාග මට්ටම හා ඒ දක්වා වූ යාන්ත්‍රණ විද්‍යාව, ඒකක හා මාන, පදාර්ථයේ ගුණ, කම්පන හා තරංග, තාපය සහ විද්‍යුතය, විද්‍යුත් මූලධර්ම, අර්ධ සන්නායක, ඩිජිටල් තාක්ෂණය, විවිධ සන්නිවේදන සහ දත්ත හුවමාරු ක්‍රම පිළිබඳව අපේක්ෂකයාගේ දැනුම විනිශ්චය කිරීම සඳහා වන ප්‍රශ්නවලින් යුක්තය. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

8.0 *තේරීම් පරිපාටිය :-*

8.1 ලිඛිත පරීක්ෂණයේ ප්‍රතිඵල අනුව ඉහළම ලකුණු ලබාගත් අයදුම්කරුවන් අතරින්, පිරවීමට අපේක්ෂිත පුරප්පාඩු ගණනට සමාන අයදුම්කරුවන් ගණන, ප්‍රතිඵලවල කුසලතා අනුපිළිවෙළ අනුව බඳවා ගනු ලැබේ. (සම්මුඛ පරීක්ෂණයේ දී මූලික සුදුසුකම් සනාථ කළ නොහැකි වන අයදුම්කරුවන් විභාගයේ දී නියමිත කුසලතා මට්ටම ලබා සිටියද බඳවා ගනු නොලැබේ.)

9.0 *අයදුම්පත්‍ර සකස් කිරීම :-*

9.1 ඉල්ලුම්පත් සකස් කළ යුත්තේ තමා විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යයෙන්ය.

9.2 සිංහලෙන් සහ දෙමළෙන් ඉදිරිපත් කරන අයදුම්පත්‍රවල ශීර්ෂයේ සඳහන් විභාගයේ නම් එම භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කළ යුතු ය.

9.3 මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව සෙ. මී. 21 x 29 (ඒ4) ප්‍රමාණයේ කඩදාසි වල දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් තමන් විසින් ඉල්ලුම්පත්‍රය සකස් කරගත යුතු ය. අංක 01 සිට 07 දක්වා ශීර්ෂ 01 පිටුවේද, අංක 08.0 - 11.1 දක්වා ශීර්ෂ 02 පිටුවේද, අංක 12.0 - 16 දක්වා ශීර්ෂ 03 පිටුවේද, අංක 17 ශීර්ෂය 04 පිටුවේද ඇතුළත් වන පරිදි ඉල්ලුම්පත්‍රය සැකසිය යුතු ය.

10. 0 *අයදුම්පත් සම්පූර්ණ කිරීම :*

10.1 අයදුම්කරු/කාරිය ගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතු ය.

10.2 පෙනී සිටින භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට අවසර නොදෙන හෙයින් නිවැරදිව සම්පූර්ණ කළ යුතු ය.

10.3 විභාග ගාස්තුව ගෙවා කුවිතාන්සිය ඒ සඳහා වෙන් කර ඇති ස්ථානයෙහි ඇලවිය යුතුය.

10.4 අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියෙකු, හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 ශ්‍රේණිගත කිරීම අනුව තෘතීය හෝ ජ්‍යෙෂ්ඨ මට්ටමේ රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතු ය.

10.5 *සාවද්‍ය තොරතුරු සැපයීම :*

මෙම විභාගය සඳහා ඉදිරිපත් වීම සඳහා කිසියම් අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැතිබව අනාවරණය වුවහොත් හෝ ඉදිරිපත් කර ඇති කිසියම් තොරතුරක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෝ යම් වැදගත් කරුණක් ඕනෑකමින් වසන් කර ඇති බව පෙනී ගියහොත් විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගයට පසුව හෝ ඔහු/ඇය ගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට ද සේවයට බඳවා ගත් පසුව ඒ බව අනාවරණය වුවහොත් සේවයෙන් පහකිරීමට ද ඉඩ ඇත.

11.0 *අයදුම්පත් යොමු කිරීම :*

11.1 සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය 2015 පෙබරවාරි 27 වැනි දින හෝ ඊට පෙර පහත දැක්වෙන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

11.2 අයදුම්පත් යොමු කිරීම :
විභාග කොමසාරිස් ජනරාල්,
සංවිධාන හා විදේශ විභාග ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 1503,
කොළඹ.

11.3 දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු ඉල්ලුම්කරුවන් අයදුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ද, රාජ්‍ය සංස්ථා, පළාත් පාලන ආයතන ආදියේ සේවයේ නියුතු වූවන් සිය ආයතන ප්‍රධානීන් මගින් ද නියමිත දිනට හෝ පෙර ඉදිරිපත් කල යුතුවේ.

11.4 අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම් පස ඉහල කෙලවරේ "ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවයේ විදුලි සංදේශ හා රේඩාර් කාර්මික නිලධාරී තනතුරට බඳවා ගැනීම - කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව" යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතුය.

11.5 සම්පූර්ණ කරන ලද අයදුම්පතෙහි හා මුදල් ගෙවූ ලදුපතෙහි ඡායා පිටපත් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

12.0 *අයදුම්පත් භාරගැනීම හා ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම :*

12.1 නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරාගත යුතු ය. ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම්පත්‍රය විභාග නිවේදනයේ දැක්වෙන ඉල්ලුම් පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු වේ. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැක.

12.2 ඉල්ලුම්පත් ලද බව දන්වනු නොලැබේ. තැපෑලේ දී අස්ථාන ගතවන ඉල්ලුම්පත් සම්බන්ධව කෙරෙන කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

12.3 මෙම නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළවන, අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාල ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. තරග විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම විභාගයට පෙනී සිටීමට හෝ මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා *ගැසට් නිවේදනය* අනුව සුදුසුකම් තිබේදැයි පරීක්‍ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ විභාග අපේක්‍ෂකත්වය අවලංගු කරනු ලැබේ.

12.4 අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළවී දින 02ක් හෝ 03ක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුනි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුයි. ඔබ වෙත තබාගත් අයදුම්පත්‍රයේ පිටපත ද, විභාග ගාස්තුවට අදාල ලදුපතෙහි පිටපත ද, ඉල්ලුම්පත්‍රය තැපෑලෙන් යොමු කිරීමේදී ලියාපදිංචි කරන ලද කුවිතාන්සියද අතැතිව ඔබගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා විභාගයේ නම නිවැරදිව සඳහන් කරමින් විභාග දෙපාර්තමේන්තුවෙන් විමසා සිටීම සුදුසුය. ඔබ කොළඹින් බැහැර අයදුම්කරුවෙකු නම් ඉහත විස්තර සමග ෆැක්ස් මගින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ලබා ගැනීම සඳහා ඔබගේ ෆැක්ස් අංකයක්ද සඳහන් ඉල්ලීම් ලිපියක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ෆැක්ස් මගින් යොමු කරමින්ම විමසා සිටීමද සුදුසු ය.

13.0 *විභාග ගාස්තු :*
විභාග ගාස්තුව රු. 750 කි. එම ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 යටතේ රජයේ ආදායමට බැර වන පරිදි දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/උප තැපැල් කාර්යාලයක් වෙත මුදලින් ගෙවා අයදුම්කරුගේ නමින් ලබා ගන්නා ලදුපත, එහි එක් දාරයක් මගින් අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන ලෙස ඇලවිය යුතුය. විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලබන අතර, විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ සිදු නොකෙරේ. ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.

14.0 *විභාගයට පෙනී සිටීම :*

14.1 මෙම විභාගය 2015 මැයි මාසය තුළ කොළඹ දී විභාග දෙපාර්තමේන්තුව විසින් සිංහල සහ දෙමළ යන මාධ්‍යවලින් පවත්වනු ලැබේ.

14.2 විභාග අපේක්‍ෂකයින් විභාගයට පෙනී සිටීමට ප්‍රථම ප්‍රවේශ පත්‍රයේ තම අත්සන සහතික කරවා ගත යුතුය. විභාග මධ්‍යස්ථානයේදී විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතු අතර, එසේ නොමැතිව විභාගයට පෙනී සිටීමට ඔබට අවසර නොලැබෙනු ඇත. තවද අපේක්‍ෂකයෙකු තමාට නියම කර ඇති විභාග මධ්‍යස්ථානයේදී විභාගයට පෙනී සිටිය යුතුය.

14.3 විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් පනවනු ලබන නීති රීති වලට විභාග අපේක්‍ෂකයන් යටත් වේ. එම නීති රීති උල්ලංඝණය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට විභාග අපේක්‍ෂකයා/අපේක්‍ෂිකාව යටත් විය යුතුය.

15.0 අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය :

විභාග ශාලාවේදී තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් අයදුම්කරුවන් තම අනන්‍යතාවය ඔප්පු කර සිටිය යුතුය. මේ සඳහා පහත සඳහන් ලේඛන පිළිගනු ඇත.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත,
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

16.0 මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව කාලගුණ විද්‍යා අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම ගැසට් පත්‍රයේ සඳහන් පොදු විභාග නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

17.0 සිංහල හා දෙමළ මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

ලලිත් චන්ද්‍රපාල,
කාලගුණ විද්‍යා අධ්‍යක්ෂ ජනරාල්,
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව.

2015 ජනවාරි මස 23 වැනි දින,
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව,
බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.

ආදර්ශ අයදුම්පත්‍රය

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ විදුලි සංදේශ හා රේඩාර් කාර්මික නිලධාරි (III ශ්‍රේණිය) තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2014 (2015)
Open Competitive Examination for Recruitment to the Post of Tele Communication and Radar Technical Officers (Grade III) of the Sri Lanka Technological Service - 2014 (2015)

* විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය (කොටුව තුළ අදාළ අංකය යොදන්න) ☐ සිංහල - 2 / දෙමළ - 3

01 (අ) මුලකුරු අගට යොදා මුලකුරු සමග නම : ඉංග්‍රීසියෙන්
උදා : (Gunawardhana M. G. B. S. K.)
(ඉංග්‍රීසි කැපිටල් අකුරින් පිරවිය යුතුයි.)

(ආ) මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :
(සිංහලෙන්/දෙමළෙන්) :————.
මහතා/මෙනවිය/මහත්මිය

(ඇ) මුලකුරුවලින් හැඳින්වෙන නම් :
(සිංහලෙන්/දෙමළෙන්) :————.

(ඈ) මුලකුරුවලින් හැඳින්වෙන නම් ඉංග්‍රීසියෙන් :
(ඉංග්‍රීසි කැපිටල් අකුරින් පිරවිය යුතුයි)

02. ජාතික හැඳුනුම්පත් අංකය :

03. ස්ත්‍රී/පුරුෂභාවය : පුරුෂ - 0 / ස්ත්‍රී - 1 ☐ (කොටුව තුළ අදාළ අංකය යොදන්න)

04. ස්ථිර ලිපිනය :

(අ) (සිංහලෙන්/දෙමළෙන්) :————.

(ආ) ඉංග්‍රීසියෙන් :
(ඉංග්‍රීසි කැපිටල් අකුරින් පිරවිය යුතුයි.)

(මෙම ලිපිනයට ප්‍රවේශ පත්‍ර තැපැල් කරනු ඇත.)

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |

(ඇ) ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :————.

(ඈ) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————.

(ඉ) ඔබගේ දුරකතන අංකය : ස්ථාවර :————. ජංගම :————.

05. (අ) උපන්දිනය : වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

(ආ) 2015.02.27 වැනි දිනට වයස : අවුරුදු : ☐☐ මාස : ☐☐ දින : ☐☐

06. විවාහක/අවිවාහක බව : විවාහක - 1 ☐

(අදාළ අංකය කොටුව තුළ ලියන්න) අවිවාහක - 2

07. ජනවර්ගය :
සිංහල - 1, ද්‍රවිඩ - 2, වෙනත් - 3 ☐
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

08. අධ්‍යාපන සුදුසුකම් :

(අ) අ. පො. ස. (සා. පෙළ) විභාගය :

*පළමුවන වර*
වර්ෂය :————.
විභාග අංකය :————.

| *අනු. අංකය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

*දෙවන වර*
වර්ෂය :————.
විභාග අංකය :————.

| *අනු. අංකය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

(ආ) අ. පො. ස. (උ. පෙළ) විභාගය :

වර්ෂය :————. විභාග අංකය :————.

| *අනු. අංකය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |

09. වෘත්තීය සුදුසුකම්/තාක්‍ෂණික සුදුසුකම් :

9.1 ලබා ඇති උපාධිය/ඩිප්ලෝමාව :—————.

9.2 අදාළ උපාධිය/ඩිප්ලෝමාව පිරිනමනු ලැබූ ආයතනයේ නම :—————.

9.3 අදාළ උපාධිය/ඩිප්ලෝමාව වලංගු වන දිනය :—————.

10. වෙනත් සුදුසුකම් :—————.

11. ඔබ කිසියම් වරදක් සඳහා උසාවියකින් දඬුවම් ලබා හෝ දැනට ඔබට එරෙහිව සිදු කෙරෙමින් පවතින අධිකරණ ක්‍රියාමාර්ගයක් පවතීද? ඔව්/නැත

11.1 ඔව් නම් විස්තර සඳහන් කරන්න. :—————.

12. අයදුම්කරු දැනට රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ රැකියාවක් කරන්නේ නම් තනතුරේ නම, සේවය කරන දෙපාර්තමේන්තුවේ නම සහ ලිපිනය :—————.

13. අයදුම්කරු මීට පෙර රජයේ/පළාත් රාජ්‍ය සේවයේ රැකියාවක් කර ඉවත් වී සිටින අයෙක් නම් එසේ ඉවත් වීමට හේතුව :—————.

14. විභාග ගාස්තු ගෙවීම පිළිබඳ තොරතුරු :
14.1 විභාග ගාස්තු ගෙවූ තැපැල්/උප තැපැල් කාර්යාලය :—————.
14.2 රිසිට්පත් අංකය :—————.
14.3 මුදල් ගෙවූ දිනය :—————.

| |
|---|
| මුදල් ගෙවූ ලදුපත නොගැළවෙන සේ අලවන්න.<br><br>ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගන්න. |

15. *අයදුම්කරුගේ සහතිකය :*

(අ) මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි.
(ආ) මා විසින් කරනු ලැබ ඇති මෙම ප්‍රකාශය අසත්‍ය බව ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට නුසුදුස්සෙකු වන බව හා පත්වීම ලැබීමෙන් පසු එසේ ඔප්පු වුවහොත් සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව දැන සිටිමි.
(ඇ) රු. . . . . ක් ගෙවා ලබාගත් ලදුපත අදාළ ස්ථානයේ අලවා ඇත.
(ඈ) තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.
(ඉ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

—————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————.

16. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :*

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ................................... නමැති අය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු/ඇය ..................... දින මා ඉදිරිපිට දී ඉහත 15 ඡේදය යටතේ අත්සන තබන ලද බවත් සහතික කරමි. තවද ඔහු/ඇය විසින් නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත අලවා ඇති බවද සහතික කරමි.

—————,
සහතික කරන්නාගේ අත්සන.

දිනය :—————.

සහතික කරන්නාගේ නම :—————.
තනතුර :—————.
ලිපිනය :—————.

(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

17. *දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය : (රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි) :*

17.1 ඉහත තොරතුරු සඳහන් ..........................මහතා/මහත්මිය/මෙනෙවිය ..................කාර්යාලයේ සේවය කරන බව ද ඔහු/ඇය .................. දින සිට .................. තනතුරක සේවය කරන බව ද සහතික කරමි.

17.2 නිලධාරියාගේ පෞද්ගලික ලිපිගොනුව අනුව, අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර පහ තුළ
වැඩ, හැසිරීම, පැමිණීම සතුටුදායකය/අසතුටුදායකය.
සියලු වැටුප් වර්ධක උපයාගෙන ඇත/නැත.
කිසිදු විනය දඬුවමකට ලක්ව නැත/ඇත.
(විනය දඬුවමකට ලක්ව තිබේනම් තොරතුරු සඳහන් කරන්න) :————.

17.3 ඉල්ලුම් කරනු ලබන තනතුරට තෝරාගනු ලැබුවහොත් වර්තමාන තනතුරින් මෙම නිලධාරියා මුදා හැරිය හැකිය./නොහැකිය.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන,

නිල මුද්‍රාව.

දිනය :————.

01-612

---

**ආපදා කළමනාකරණ අමාත්‍යාංශය**

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව

**ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාලගුණ විද්‍යා නිරීක්ෂක/සන්නිවේදක තනතුරු සඳහා (පුහුණු කිරීමේ ශ්‍රේණියට) බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2014 (2015)**

1.0 කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවෙහි, පුරප්පාඩුව පවත්නා ශ්‍රී ලංකා තාක්ෂණ සේවයෙහි තනතුරු සඳහා පුහුණු කිරීමේ ශ්‍රේණියට බඳවා ගැනීමට පැවැත්වෙන විවෘත තරග විභාගය සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1.1 තනතුරු නාමය : කාලගුණ විද්‍යා නිරීක්ෂක/සන්නිවේදක
1.2 තනතුරෙහි රාජකාරි ස්වභාවය

* කාලගුණ විද්‍යාත්මක දත්ත රැස් කිරීම
* කාලගුණ විද්‍යා උපකරණ නඩත්තු කිරීම
* කාලගුණ විද්‍යා දත්ත බාහිර ආයතනයන්ට සැපයීම
* කාලගුණ විද්‍යා දත්ත වෙබ් පිටුවට ඇතුළත් කිරීම
* විශේෂ කාලගුණික දත්ත පිළිබඳ අවධානයෙන් සිටීම සහ ඒවා වාර්තා කිරීම
* දෙපාර්තමේන්තු ප්‍රධානී විසින් පවරනු ලබන වෙනත් කාර්යයන්

2.0 පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම් දිනය පත්වීම් බලධරයා විසින් නිශ්චය කරනු ලැබේ. පුරප්පාඩු සියල්ලම හෝ කිසියම් ගණනක් නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත.

3.0 වැටුප :

වගුව - අංක 01

| *ශ්‍රේණිය* | *වැටුප් පරිමාණය* | *ආරම්භක මාසික වැටුප* |
|---|---|---|
| පුහුණු කිරීමේ ශ්‍රේණිය | නොමැත | 1 වසර මාසිකව රු. 12,920<br>2 වසර මාසිකව රු. 13,040<br>(රා. ප. ව. 06/2006(II) හි 14 වැනි ඡේදයේ 09 වැනි විධිවිධාන අනුව) |
| III ශ්‍රේණිය | මාසිකව රු. 15,005 - 4 x 180 - 6 x 240 - 11 x 320 - 20 x 360 - රු. 27,885<br>(එම්එන්3 - 2006ඒ) | රු. 15,005 |

| ශ්‍රේණිය | වැටුප් පරිමාණය | ආරම්භක මාසික වැටුප |
|---|---|---|
| II ශ්‍රේණිය | මාසිකව රු. 15,005 - 4 x 180 - 6 x 240 - 11 x 320 - 20 x 360 - රු. 27,885 (12 වැනි වැටුප් පියවරෙන් ආරම්භ වේ) (එම්එන් 3 - 2006ඒ) | රු. 17,485 |
| 1 ශ්‍රේණිය | මාසිකව රු. 15,005 - 4 x 180 - 6 x 240 - 11 x 320 - 20 x 360 - රු. 27,885 (23 වැනි වැටුප් පියවරෙන් ආරම්භ වේ.) (එම්එන් 3 - 2006ඒ) | රු. 21,045 |
| විශේෂ ශ්‍රේණිය | මාසිකව රු. 20,030 - 11 x 365 - 18 x 500 - රු. 33,045 (එම්එන් 7 - 2006ඒ) | රු. 21,125 |

4.0 *තනතුරෙහි සේවා කොන්දේසි* :

4.1 පුහුණු කිරීමේ ශ්‍රේණියට බඳවා ගනු ලබන අයදුම්කරුවන් දෙවසරක පුහුණු අවසානයේ පෙනී සිටිය යුතු යෝග්‍යතා පරීක්ෂණය සමත් වූ විට ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණියේ කාලගුණ විද්‍යානිරීක්ෂක/සන්නිවේදක තනතුරට බඳවා ගනු ලැබේ.

4.2 මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත ය. පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වන අතර, තෝරාගනු ලබන අයදුම්කරුවන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සූදානම්ව සිටිය යුතු ය. මෙම ගැසට් නිවේදනයේ ආරම්භයේ ඇති රාජ්‍ය සේවයට පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසිවලට ද ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාව හා එයට කලින් කලට කරනු ලබන සංශෝධන, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති, ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි හා රජය මගින් රාජ්‍ය සේවය පිළිබඳව නිකුත් කර ඇති හා කරනු ලබන වෙනත් නියෝග හා රෙගුලාසිවලට ද තෝරාගනු ලබන්නා යටත් වේ.

4.3 රාජ්‍ය භාෂාව නොවන භාෂා මාධ්‍යයකින් බඳවාගත් නිලධාරියෙකු පත් කළ දින සිට අවුරුදු 03ක් ඇතුළත රාජ්‍ය භාෂා පරීක්ෂණයෙන් සමත් විය යුතු ය. නියමිත කාලය තුළ මෙම පරීක්ෂණයෙන් සමත්වීමට අපොහොසත් වීම ඊළඟ වැටුප් වර්ධක විලම්භනය වීමට හේතු වනු ඇත.

4.4 ස්ථිර පත්වීමේ දින සිට වසර 05ක් ඇතුළත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 1/2014 හි දැක්වෙන පරිදි තම තනතුරට අදාළ වන මට්ටමේ දෙවන රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගත යුතු වේ. අදාළ කාලය තුළ එම ප්‍රවීණතාව ලබා ගැනීමට අපොහොසත් වුවහොත් එම ප්‍රවීණතාව ලබා ගන්නා තුරු වැටුප් වර්ධක නතර කෙරේ.

4.5 දෙවසරක පුහුණුව පූර්ණ වශයෙන් සම්පූර්ණ කරන බවටද, දෙවසරක පුහුණුවෙන් පසු වසර 05ක් දෙපාර්තමේන්තුවේ සේවය කරන බවට ද, දෙපාර්තමේන්තුව සමග ගිවිසුමකට එළඹිය යුතු අතර ඔහු/ඇය පුහුණුව ආරම්භක දිනයෙන් පසු පුහුණුව හැර ගියහොත් හෝ ගිවිසුම්ගත කාලය දෙපාර්තමේන්තුවේ සේවය කිරීමට අපොහොසත් වුවහොත් පුහුණුව සඳහා රජයට වැයවූ මුදලද, රු. 250,000 ක වලංගු මුදලක් ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට ගෙවන බවටද දෙපාර්තමේන්තුව විසින් පිළිගන්නා වූ ඇපකරුවන් දෙදෙනෙකුගේ සහතික වීම සහිතව බැඳුම්කරයක් පුහුණුව ආරම්භ කිරීමට පෙර ලියා අත්සන් කළ යුතුය.

4.6 රාජකාරි වේලාවන් සෑම විටම සාමාන්‍ය කාර්යාල වේලාවන් නොවන අතර දිවා රාත්‍රී දෙකෙහිම සහ සෙනසුරාදා, ඉරිදා සහ රජයේ නිවාඩු දිනයන්හි ද යෙදෙනු ඇත. කෘත්‍ය ලේඛන අනුවද රාජකාරි කිරීමට සිදුවේ.

4.7 තෝරාගනු ලැබූ ඇයදුම්කරුවන් දිවයිනේ කවර පෙදෙසක වුවද සේවය කළ යුතු වේ.

5.0 *සුදුසුකම්* :-

5.1 *මූලික සුදුසුකම්* :

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වීම,

(ආ) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවම වයස අවුරුදු 18 වන අතර, උපරිම වයස අවුරුදු 30 වේ.
(ඒ අනුව 1997.02.27 වැනි දිනට හෝ ඊට පෙර හා 1985.02.27 වැනි දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.)

5.2. *අධ්‍යාපන සුදුසුකම්* :

(අ) සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථ සහිතව එකවර විෂයයන් (06) කින් අ. පො. ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම;

*සහ*

(*ආ*) විෂයයන් 03කින් අ. පො. ස. (උසස් පෙළ) විභාගය එකවර සමත්ව තිබීම, විෂයය සංයුතිය පහත එක් ආකාරයකට විය යුතු ය.

(1) භෞතික විද්‍යාව, ශුද්ධ ගණිතය සහ ව්‍යවහාරික ගණිතය,

(2) භෞතික විද්‍යාව සමග,

(i) ශුද්ධ ගණිතය/ව්‍යවහාරික/සංයුක්ත ගණිතය යන විෂයයන්ගෙන් එකක්,

*සහ*

(ii) රසායන විද්‍යාව/කෘෂි විද්‍යාව/තොරතුරු තාක්‍ෂණය/පරිගණක විද්‍යාව යන විෂයයන්ගෙන් එකක්.

5.3 *කායික සුදුසුකම් :*

සෑම අපේක්‍ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය. බඳවා ගැනීමෙන් පසු පවත්වන වෛද්‍ය පරීක්‍ෂණයේදී අයෝග්‍ය බව තහවුරු වුවහොත් තනතුරට නුසුදුසු සේ සලකනු ලැබේ.

*සටහන* : සෑම අයදුම්කරුවෙකුම තනතුරට අදාළ සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට හෝ ඊට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

6.0 *විභාග පටිපාටිය :-*

විභාගය විෂයයන් දෙකකින් යුත් ලිඛිත පරීක්‍ෂණයකි. මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත්වෙන අතර ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

| | *ලැබිය හැකි මුළු ලකුණු ප්‍රමාණය* | *සමත්වීම සඳහා ලැබිය යුතු අවම ලකුණු ප්‍රතිශතය* | *කාලය* |
|---|---|---|---|
| I. බුද්ධි පරීක්‍ෂණය | 100 | 40% | පැය 01 |
| II. විෂයානුබද්ධ තාක්‍ෂණික ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න පත්‍රය | 100 | 40% | පැය 02 |

7.0 *විෂය නිර්දේශය :*

(i) *බුද්ධි පරීක්‍ෂණය* : මෙම ප්‍රශ්න පත්‍රය අපේක්‍ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාවයත්, ඔහුගේ විශ්ලේෂණ තත්වයක්, තීරණය කිරීමේ ශක්තියත් විනිශ්චය කිරීම සඳහා වන බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50කින් යුක්ත වන අතර ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.

(ii) *විෂයානුබද්ධ තාක්‍ෂණික ප්‍රශ්න පත්‍රය* : භෞතික විද්‍යාව සහ විෂය ආශ්‍රිත අ. පො. ස. (උ.පෙළ) විභාග මට්ටම හා ඒ දක්වා වූ යාන්ත්‍රණ විද්‍යාව, ඒකක හා මාන, පදාර්ථයේ ගුණ, කම්පන හා තරංග, තාපය සහ විද්‍යුතය යන විෂය දැනුම නිශ්චය කෙරෙන ප්‍රශ්නවලින් යුක්ත වන අතර ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

8.0 *තේරීම් පරිපාටිය :-*

8.1 ලිඛිත පරීක්‍ෂණයේ ප්‍රතිඵල අනුව ඉහළම ලකුණු ලබාගත් අයදුම්කරුවන් අතරින්, පිරවීමට අපේක්ෂිත පුරප්පාඩු ගණනට සමාන අයදුම්කරුවන් ගණන, ප්‍රතිඵලවල කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගනු ලැබේ. (සම්මුඛ පරීක්‍ෂණයේ දී මූලික සුදුසුකම් සනාථ කළ නොහැකි වන අයදුම්කරුවන් විභාගයේ දී නියමිත කුසලතා මට්ටම ලබා සිටියද බඳවා ගනු නොලැබේ.)

9.0 *බඳවා ගැනීම :-*පුහුණු කිරීමේ ශ්‍රේණියට තෝරාගනු ලබන්නන් දෙවසරක පුහුණුව අවසානයේ පැවැත්වෙන පරීක්‍ෂණය සමත් වූ පසු ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවයේ III ශ්‍රේණියට පත් කෙරේ.

10.0 *අයදුම්පත්‍ර සකස් කිරීම :-*

10.1 ඉල්ලුම්පත් සකස් කළ යුත්තේ තමා විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යයෙන්ය.

10.2 සිංහලෙන් සහ දෙමළෙන් ඉදිරිපත් කරන අයදුම්පත්‍රවල ශීර්ෂයේ සඳහන් විභාගයේ නම් එම භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් සඳහන් කළ යුතු ය.

10.3 මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව සෙ. මී. 21 x 29 (ඒ4) ප්‍රමාණයේ කඩදාසිවල දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් ඉල්ලුම් පත්‍රය සකස් කරගත යුතු ය. අංක 01 සිට 04 (ඉ) දක්වා ශීර්ෂ 01 පිටුවේද, අංක 05.0 - 09.3 දක්වා ශීර්ෂ 02 පිටුවේද, අංක 10.0 - 15 දක්වා ශීර්ෂ 03 පිටුවේද, අංක 16.0 - 17.3 දක්වා ශීර්ෂ 04 පිටුවේද ඇතුළත් වන පරිදි ඉල්ලුම්පත්‍රය සැකසිය යුතු ය.

11. 0 *අයදුම්පත් සම්පූර්ණ කිරීම :*

11.1 අයදුම්කරු/කාරිය ගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතු ය.

11.2 පෙනී සිටින භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට අවසර නොදෙන හෙයින් නිවැරදිව සම්පූර්ණ කළ යුතු ය.

11.3 විභාග මධ්‍යස්ථාන අංක උපලේඛන අංක 01 හි සඳහන් පරිදි සටහන් කළ යුතුය. (විභාග මධ්‍යස්ථාන පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලබන නමුත් යම් මධ්‍යස්ථානයකට ප්‍රමාණවත් අයදුම්කරුවන් නොමැති විට එම මධ්‍යස්ථානය අවලංගු කර අපේක්ෂකයන් ආසන්නතම මධ්‍යස්ථානයට යොමු කරවනු ලැබේ.)

11.4 විභාග ගාස්තුව ගෙවා කුවිතාන්සිය ඒ සඳහා වෙන් කර ඇති ස්ථානයෙහි ඇලවිය යුතුය.

11.5 අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියෙකු, හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 ශ්‍රේණිගත කිරීම අනුව තෘතීය හෝ ජ්‍යෙෂ්ඨ මට්ටමේ රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතු ය.

11.6 *සාවද්‍ය තොරතුරු සැපයීම :*

මෙම විභාගය සඳහා ඉදිරිපත් වීම සඳහා කිසියම් අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් හෝ ඉදිරිපත් කර ඇති කිසියම් තොරතුරක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෝ යම් වැදගත් කරුණක් ඕනෑකමින් වසන් කර ඇති බව පෙනී ගියහොත් විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගයට පසුව හෝ ඔහු/ඇය ගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට ද සේවයට බඳවා ගත් පසුව ඒ බව අනාවරණය වුවහොත් සේවයෙන් පහකිරීමට ද ඉඩ ඇත.

12.0 *අයදුම්පත් යොමු කිරීම :*

12.1 සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය 2015 පෙබරවාරි මස 27 වැනි දින හෝ ඊට පෙර පහත දැක්වෙන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

12.2 *අයදුම්පත් යොමු කිරීම :*
විභාග කොමසාරිස් ජනරාල්,
සංවිධාන හා විදේශ විභාග ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 1503,
කොළඹ.

12.3 දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ නියුතු ඉල්ලුම්කරුවන් අයදුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ද, රාජ්‍ය සංස්ථා, පළාත් පාලන ආයතන ආදියේ සේවයේ නියුතු වූවන් සිය ආයතන ප්‍රධානීන් මගින් ද නියමිත දිනට හෝ පෙර ඉදිරිපත් කල යුතුවේ.

12.4 අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම් පස ඉහල කෙලවරේ "තාක්ෂණ සේවයේ තනතුරුවලට බඳවා ගැනීම - කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව" යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතුය.

12.5 සම්පූර්ණ කරන ලද අයදුම්පතෙහි හා මුදල් ගෙවූ ලදුපතෙහි ඡායා පිටපත් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

13.0 *අයදුම්පත් භාර ගැනීම හා ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම :*

13.1 නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරාගත යුතු ය. ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම්පත්‍රය විභාග නිවේදනයේ දැක්වෙන ඉල්ලුම් පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසාල බැලිය යුතු වේ. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැක.

13.2 ඉල්ලුම්පත් ලද බව දන්වනු නොලැබේ. තැපෑලේ දී අස්ථාන ගතවන ඉල්ලුම්පත් සම්බන්ධව කෙරෙන කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

13.3 මෙම නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළවන, අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. තරග විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම විභාගයට පෙනී සිටීමට හෝ මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා ගැසට් නිවේදනය අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

13.4 අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළවී දින 02ක් හෝ 03ක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුනි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුයි. ඔබ වෙත තබාගත් අයදුම්පත්‍රයේ පිටපත ද, විභාග ගාස්තුවට අදාළ ලදුපතෙහි පිටපත ද, ඉල්ලුම්පත්‍රය තැපෑලෙන් යොමු කිරීමේදී ලියාපදිංචි කරන ලද කුවිතාන්සියද අතැතිව ඔබගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා විභාගයේ නම නිවැරදිව සඳහන් කරමින් විභාග දෙපාර්තමේන්තුවෙන් විමසා සිටීම සුදුසුය. ඔබ කොළඹින් බැහැර අයදුම්කරුවෙකු නම් ඉහත විස්තර සමග ෆැක්ස් මගින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ලබා ගැනීම සඳහා ඔබගේ ෆැක්ස් අංකයක්ද සඳහන් ඉල්ලීම් ලිපියක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ෆැක්ස් මගින් යොමු කරමින්ම විමසා සිටීමද සුදුසු ය.

14.0 *විභාග ගාස්තු :*

විභාග ගාස්තුව රු. 750 කි. එම ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 යටතේ රජයේ ආදායමට බැර වන පරිදි දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/උප තැපැල් කාර්යාලයක් වෙත මුදලින් ගෙවා අයදුම්කරුගේ නමින් ලබා ගන්නා ලදුපත, එහි එක් දාරයක් මගින් අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන ලෙස ඇලවිය යුතුය. විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලබන අතර, විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ සිදු නොකෙරේ. ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.

15.0 *විභාගයට පෙනී සිටීම :*

15.1 විභාග අපේක්ෂකයින් විභාගයට පෙනී සිටීමට ප්‍රථම ප්‍රවේශ පත්‍රයේ තම අත්සන සහතික කරවා ගත යුතුය. විභාග මධ්‍යස්ථානයේදී විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතු අතර, එසේ නොමැතිව විභාගයට පෙනී සිටීමට ඔබට අවසර නොලැබෙනු ඇත. තවද අපේක්ෂකයෙකු තමාට නියම කර ඇති විභාග මධ්‍යස්ථානයේදී විභාගයට පෙනී සිටිය යුතුය.

15.2 විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීති රීති උල්ලංඝණය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට විභාග අපේක්ෂකයා/අපේක්ෂිකාව යටත් විය යුතුය.

16.0 *අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය :*

විභාග ශාලාවේදී තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන අයුරින් අයදුම්කරුවන් තම අනන්‍යතාවය ඔප්පු කර සිටිය යුතුය. මේ සඳහා පහත සඳහන් ලේඛන පිළිගනු ඇත.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත;
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

17.0 මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව කාලගුණ විද්‍යා අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම ගැසට් පත්‍රයේ සඳහන් පොදු විභාග නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

18.0 සිංහල හා දෙමළ මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

ලලිත් චන්ද්‍රපාල,
කාලගුණ විද්‍යා අධ්‍යක්ෂ ජනරාල්,
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව.

2015 ජනවාරි මස 23 වැනි දින,
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව,
බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.

*උපලේඛනය - 01*

*විභාගය පවත්වන මධ්‍යස්ථාන හා මධ්‍යස්ථාන අංක*

| *අනු. අංකය* | *මධ්‍යස්ථානය* | *මධ්‍යස්ථාන අංකය* |
|---|---|---|
| 01 | කොළඹ | 01 |
| 02 | නුවර | 02 |
| 03 | ගාල්ල | 03 |
| 04 | කුරුණෑගල | 04 |

| අනු. අංකය | මධ්‍යස්ථානය | මධ්‍යස්ථාන අංකය |
|---|---|---|
| 05 | අනුරාධපුරය | 05 |
| 06 | රත්නපුර | 06 |
| 07 | බදුල්ල | 07 |
| 08 | යාපනය | 08 |
| 09 | වවුනියාව | 09 |
| 10 | මඩකලපුව | 10 |

**ආදර්ශ අයදුම්පත්‍රය**

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවයේ කාලගුණ විද්‍යා නිරීක්‍ෂක/සන්නිවේදක තනතුරු සඳහා (පුහුණු කිරීමේ ශ්‍රේණියට) බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2014 (2015)

Open Competitive Examination for Recruitment to the Post of Meteorological Observers/Communicators (to the Trainig Grade) of the Sri Lanka Technological Service of the Department of Meteorology - 2014 (2015)

* විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය (කොටුව තුළ අදාළ අංකය යොදන්න) ☐ සිංහල - 2 දෙමළ - 3

* විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කරන විභාග මධ්‍යස්ථාන හා මධ්‍යස්ථාන අංක :

| මනාප අංකය | විභාග මධ්‍යස්ථානය | මධ්‍යස්ථාන අංකය |
|---|---|---|
| 1 | | |
| 2 | | |
| 3 | | |

(ගැසට් නිවේදනයේ උපලේඛන අංක 1 අනුව ඔබ විභාගයට පෙනී සිටීමට අපේක්‍ෂා කරන නගර හා අදාළ අංක කැමැත්තේ අනුපිළිවෙලින් සඳහන් කරන්න.)

01 (අ) මුලකුරු අගට යොදා මුලකුරු සමග නම : ඉංග්‍රීසියෙන්
උදා : (GUNAWARDHANA M. G. B. S. K.)
(ඉංග්‍රීසි කැපිටල් අකුරින් පිරවිය යුතුයි.)

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |

(ආ) මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :
(සිංහලෙන්/දෙමළෙන්) :————.
මහතා/මෙනවිය/මහත්මිය

(ඇ) මුලකුරුවලින් හැඳින්වෙන නම් :
(සිංහලෙන්/දෙමළෙන්) :————.

(ඈ) මුලකුරු වලින් හැඳින්වෙන නම් ඉංග්‍රීසියෙන් :
(ඉංග්‍රීසි කැපිටල් අකුරින් පිරවිය යුතුයි)

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |

02. ජාතික හැඳුනුම්පත් අංකය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

03. ස්ත්‍රී/පුරුෂභාවය : පුරුෂ - 0
ස්ත්‍රී - 1 (කොටුව තුළ අදාළ අංකය යොදන්න)

04. ස්ථිර ලිපිනය :—————.

(අ) (සිංහලෙන්/දෙමළෙන්) :—————.

(ආ) ඉංග්‍රීසියෙන් :
(ඉංග්‍රීසි කැපිටල් අකුරින් පිරවිය යුතුයි.)

(මෙම ලිපිනයට ප්‍රවේශ පත්‍ර තැපැල් කරනු ඇත.)

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |

(ඇ) ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :—————.

(ඈ) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :—————.

(ඉ) ඔබගේ දුරකතන අංකය : ස්ථාවර :—————. ජංගම :—————.

05. (අ) උපන් දිනය : වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

(ආ) 2015.02.27 වැනි දිනට වයස : අවුරුදු ☐☐ මාස ☐☐ දින ☐☐

06. විවාහක/අවිවාහක බව : විවාහක - 1

(අදාළ අංකය කොටුව තුළ ලියන්න) අවිවාහක - 2

07. ජනවර්ගය :
සිංහල - 1, ද්‍රවිඩ - 2, වෙනත් - 3
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

08. අධ්‍යාපන සුදුසුකම් :
(අ) අ. පො. ස. (සා. පෙළ) විභාගය :

*පළමුවන වර*
වර්ෂය :—————.
විභාග අංකය :—————.

| *අනු. අංකය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

*දෙවන වර*
වර්ෂය :—————.
විභාග අංකය :—————.

| *අනු. අංකය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

(ආ) අ. පො. ස. (උ. පෙළ) විභාගය :

වර්ෂය :—————. විභාග අංකය :—————.

| *අනු. අංකය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |

09. *වෘත්තීය සුදුසුකම්/තාක්‍ෂණික සුදුසුකම් :*
   9.1 ලබා ඇති උපාධිය/ඩිප්ලෝමාව :————.

   9.2 අදාළ උපාධිය/ඩිප්ලෝමාව පිරිනමනු ලැබූ ආයතනයේ නම :————.

   9.3 අදාළ උපාධිය/ඩිප්ලෝමාව වලංගු වන දිනය :————.

10. *වෙනත් සුදුසුකම් :*————.

11. ඔබ කිසියම් වරදක් සඳහා උසාවියකින් දඬුවම් ලබා හෝ දැනට ඔබට එරෙහිව සිදු කෙරෙමින් පවතින අධිකරණ ක්‍රියාමාර්ගයක් පවතීද? ඔව්/නැත
   11.1 ඔව් නම් විස්තර සඳහන් කරන්න. :————.

12. අයදුම්කරු දැනට රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ රැකියාවක් කරන්නේ නම් තනතුරේ නම, සේවය කරන දෙපාර්තමේන්තුවේ නම සහ ලිපිනය :————.

13. අයදුම්කරු මීට පෙර රජයේ/පළාත් රාජ්‍ය සේවයේ රැකියාවක් කර ඉවත් වී සිටින අයෙක් නම් එසේ ඉවත් වීමට හේතුව :————.

14. *විභාග ගාස්තු ගෙවීම පිළිබඳ තොරතුරු :*
   14.1 විභාග ගාස්තු ගෙවූ තැපැල්/උප තැපැල් කාර්යාලය :————.
   14.2 රිසිට්පත් අංකය :————.
   14.3 මුදල් ගෙවූ දිනය :————.

| |
|---|
| මුදල් ගෙවූ ලදුපත නොගැළවෙන සේ අලවන්න.<br><br>ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගන්න. |

15. *අයදුම්කරුගේ සහතිකය :*

   (අ) මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි.
   (ආ) මා විසින් කරනු ලැබ ඇති මෙම ප්‍රකාශය අසත්‍ය බව ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට නුසුදුස්සෙකු වන බව හා පත්වීම ලැබීමෙන් පසු එසේ ඔප්පු වුවහොත් සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව දැන සිටිමි.
   (ඇ) රු. . . . . ක් ගෙවා ලබාගත් ලදුපත අදාළ ස්ථානයේ අලවා ඇත.
   (ඈ) තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.
   (ඉ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

16. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :*

මෙම අයදුම්පත ඉදිරිපත් කරන .................................. නමැති අය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු/ඇය .................... දින මා ඉදිරිපිට දී ඉහත 15 ඡේදය යටතේ අත්සන තබන ලද බවත් සහතික කරමි. තවද ඔහු/ඇය විසින් නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත අලවා ඇති බවද සහතික කරමි.

————,
සහතික කරන්නාගේ අත්සන.

දිනය :————.

සහතික කරන්නාගේ නම :————.
තනතුර :————.
ලිපිනය :————.

(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

17. *දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය : (රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි) :*

17.1 ඉහත තොරතුරු සඳහන් ..........................මහතා/මහත්මිය/මෙනෙවිය ..................කාර්යාලයේ සේවය කරන බව ද ඔහු/ඇය .................. දින සිට .................. තනතුරක සේවය කරන බව ද සහතික කරමි.

17.2 නිලධාරියාගේ පෞද්ගලික ලිපිගොනුව අනුව, අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර පහ තුළ වැඩ, හැසිරීම, පැමිණීම සතුටුදායකය/අසතුටුදායකය.
සියලු වැටුප් වර්ධක උපයාගෙන ඇත/නැත.
කිසිදු විනය දඬුවමකට ලක්ව නැත/ඇත.
(විනය දඬුවමකට ලක්ව තිබේ නම් තොරතුරු සඳහන් කරන්න) :————.

17.3 ඉල්ලුම් කරනු ලබන තනතුරට තෝරාගනු ලැබුවහොත් වර්තමාන තනතුරින් මෙම නිලධාරියා මුදා හැරිය හැකිය./නොහැකිය.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන,

නිල මුද්‍රාව.

දිනය :————.

01-611

---

## නිවැරදි කිරීමයි

**ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය**

2015.01.02 වැනි දින අංක 1896 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* I කොටස II(ආ) ඡේදය—විභාග, විභාග ප්‍රතිඵල ආදිය කොටසේ 01-92 දරන නිවේදනයේ සඳහන් පාඨමාලා අංකවලට අනුව එහි සංශෝධනය විය යුතු කරුණු පහත පරිදි වේ.

* අංක 12, 13, 14, 15 වෙනුවට අංක 11, 12, 13, 14 පාඨමාලා සඳහා නිළ ඇඳුම් සහ පොත් සඳහා පමණක් ගෙවීම් කිරීම හෝ මාසිකව ලබාදෙන දීමනාවෙන් අඩු කිරීම හෝ කරනු ලබයි.

* අංක 12, 13, 14 පාඨමාලා වෙනුවට 11, 12, 13 පාඨමාලා සඳහා ආධුනිකයන්ට මාසික දීමනා ගෙවනු ලබයි.

කේ. ඩී. එන් ද සිල්වා,
සහකාර අධ්‍යක්ෂ.

01-601